**රත්නපුර මහා නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින නගරාධිපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ඉටුකල කර්මාන්ත 06 කට අදාල රු. 13,244,244 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල කර්මාන්ත ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් ගැලපීම් කිරීමට සටහන් කරගත් බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල ලැබී තිබුණු පෙරසැරි ගාස්තු සහ අනවසර සේවා ගාස්තු රු. 9,723,276 ක් තැන්පතු ගිණුමට බැර කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බවත්, ඒ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු කඩකුලී ගිණුමේ ශේෂය රු. 8,075,932 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළී ආදායම රු. 7,694,821 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂය තුල රැස් කරන ලද ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ එකතුව රු. 4,832,778 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂය තුල මිලදී ගෙන ඇති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඊ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල පෙර ගෙවුම් ගිණුමේ ශේෂය රු. 2,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂය තුල සිදුවන සියළු ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම රු. 1,937,392 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම මඟින් ගැලපුම් කිරීමට සටහන් කරගත් බව දන්වමි. |
| (ඍ) | සමාලෝචිත වර්ෂයට අදාල බදු ආදායම රු. 1,919,400 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රදාන මුදල් වර්ෂයේ ආදායමට බැර කරන බව දන්වමි. |
| (එ) | පිරිවැය රු. 1,329,500 ක් වූ මෝටර් රථ හා කරත්ත ඉවත් කිරීම් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂය තුල ඉවත් කරන ලද වත්කම්වල පිරිවැය වත්කම් ගිණුමෙන් ඉවත්කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ආපසු ගෙවීම් රු. 1,058,820 ක් සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි. | වර්ෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුල ලද රු. 1,037,407 ක් වූ ආදායම්, මුදල් පොත තුල දෙවරක් සටහන් කර තිබුණි. | සියළු ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයට අදාල කඩකුළී රු. 943,321 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසානයට ගලි බවුසර් නිදන් අරමුදල් ගිණුමේ ශේෂය රු. 621,372 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගනුදෙනු වලට අදාල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ග) | සැලසුම් කමිටු දීමනා වශයෙන් ගෙවන ලද රු. 330,500 ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර, එය මුදල් පොත තුල දෙවරක් සටහන් කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ච) | වර්ෂයට අදාල එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීමේදී වියදම් පාලන ගිණුම රු. 108,863 ක් අඩුවෙන්ද අතැති තොග ගිණුම රු. 108,863 ක් වැඩියෙන්ද බැර කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ජ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛන හා ශේෂ තහවුරු කිරීම් අනුව ශේෂයන් අතර එකතුව රු. 44,310,830 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ට) | සභාවේ බැංකු ගිණුම් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ සාරාංශ මුදල් පොත් අනුව ශේෂය අතර රු. 21,986,287 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------------- | ------------------ | ------------ | ------------------------ |
| (අ) | 1987 අංක 19 දරන මහා නගර සභා ආඥා පනත | | | |
| | (i) 42(අ) වගන්තිය | අනවසර ඉදිකිරීම් 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් නීති නිලධාරී වෙත යොමු කර ලබාගත් උපදෙස් අනුව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| | (ii) 127(1) වගන්තිය හා (3) වගන්තිය | 2017 සහ 2018 වර්ෂ තුල නිකුත් කල සංවර්ධන අවසර පත්‍ර 122 කින් 117 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | යොමුගත විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබාදීම සිදු කරනු ලබන්නේ අනුමත සැලැස්මට අනුකූලව ඉදිකිරීම් සිදුකර ඇත්නම් පමණක් බවත් බලපත්‍ර කාලය දීර්ඝ කර ගැනීම හා අනුකූලතා සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් පාරිභෝගිකයින් වෙත දැනුම් දීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | 1978 අංක 01 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10(5) හා 10(6) වගන්ති | වලංගු බලපත්‍ර කාලසීමාව අවසන් වී ඇති නමුත් නැවත දීර්ඝ කරගෙන නොමැති සංවර්ධන බලපත්‍ර 109 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | යොමුගත විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බලපත්‍ර කාලය දීර්ඝ කර ගැනීම සඳහා බලපත්‍රලාභියා වෙත දැනුම් දීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ඉකුත් තැන්පත් රු. 420,000 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 4.3 ඡේදය | සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුල රු. 804,816 ක් වැයකර වාහන 04 ක් අළුත්වැඩියා කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වනවිට චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා කාර්යසාධන ගිවිසුම් සකස් කරමින් පවතින දන්වමි. |
| (ඉ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභීන් වෙත අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 120,052,443 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 68,672,792 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 30,000,000 | 28,007,750 | 29,076,630 | 29,364,290 | 30,500,000 | 29,175,731 | 26,021,465 | 28,962,158 |
| කුලී | 84,047,258 | 72,078,670 | 72,505,841 | 37,220,063 | 68,398,946 | 66,152,480 | 63,173,522 | 28,362,641 |
| බලපත්‍ර ගාස්තු | 5,426,500 | 4,981,422 | 4,981,463 | - | 4,723,000 | 3,073,149 | 3,073,149 | - |
| වෙනත් ආදායම් | 103,662,800 | 136,148,114 | 135,511,919 | 68,416,387 | 77,862,450 | 78,936,190 | 47,332,292 | 37,628,458 |
| | 223,136,558 | 241,215,956 | 242,075,853 | 135,000,740 | 181,484,396 | 177,337,550 | 139,600,428 | 94,953,257 |

## 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 28,647,204 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම හිඟ වරිපනම් ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණයක් ද ඉදිරිපත් නොකෙරුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් බිල්පත් අංශය භාවිතා කරන වසර 20 ක් පැරණි මෘදුකාංගය මඟින් වරිපනම් හිඟ ශේෂයන්ගේ කාල විශ්ලේෂණයක් ලබාගැනීමේ හැකියාවක් නොමැති බව දන්වමි. |
| (ii) | වරිපනම් බදු අයකිරීම සඳහා සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කලයුතු වුවද, 1997 වර්ෂයේ තක්සේරුව අනුව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් අයකර තිබුණි. 2005 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව ක්‍රියාත්මක කිරීම මහා සභාව සහ මුදල් කාරක සභාව විසින් අවස්ථා දෙකකදී ප්‍රමාද කර තිබුණි. | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුවේ. | 2018 වර්ෂයේ මැද භාගයේ සිට තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ කරනු ලැබූ සාකච්ඡා කිහිපයකින් අනතුරුව 2019 ජූනි 10 දින සිට නව තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තු විසින් ආරම්භ කර ඇති බවත්, තක්සේරු වාර්තා ලැබීමෙන් අනතුරුව නව වරිපනම් ගාස්තු අය කිරීමේ හැකියාවක් පවතින බවත් දන්වමි. |
| **(ආ)** | **වෙනත් බදු** | | |
| | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් කසළ බදු ආදායම් පිළිවෙලින් රු. 1,000,000 ක් හා රු. 2,500,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, කසළ බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කසළ බදු සඳහා අතුරු ව්‍යවස්ථාව සකස් කර සබරගමුව පළාත් සභාව වෙත අනුමැතිය සඳහා යොමුකර තිබුණද, එය විසුරුවා හැර තිබීම හේතුවෙන් අනුමැතිය ලබාගත නොහැකි වී ඇත. |

**2.2.3 කුළී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහජන පොළ කඩ බක්කි 30 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු හිඟ ගාස්තු එකතුව රු. 1,948,215 ක් වූ අතර, ඉන් රු. 1,049,375 ක් වසර 01 ත් 03 ත් අතර කාලයකට අදාල විය. මාස 03 කට වැඩි කාලයක් කුළිය හිඟහිට ඇති කඩ බක්කි 20 ක් මුද්‍රා තැබීමට තීරණය කර තිබුණද එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ කුළී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නාගරික වැඩ දෙපාර්තමේන්තුව වෙත මෙම කඩ මුද්‍රා තැබීමට අවශ්‍ය දැල් ආවරණ සකස් කර දෙන ලෙස දැනුම් දී ඇති බවත් ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කරන බවත් දන්වමි. |
| (ආ) | 2015 වර්ෂයේදී බදු දී ඇති දෙමුවාවත මැණික් වෙළඳ සංකීර්ණයේ කඩකාමර වලින් ප්‍රදාන මුදල් රු. 11,235,475 ක් සහ කඩකුළී රු. 1,010,000 ක් හිඟවීම මත නඩු පැවරීමට තීරණය කර තිබුණද, එවැන්නක් සිදුකර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුවේ. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති නිලධාරී වෙත ලිපිගොනු භාරදී ඇති බව දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර බලපත්‍ර ලබා ගතයුතු ආයතන 15 ක් බලපත්‍ර ලබා නොගැනීම හා කල් ඉකුත්ව තිබූ බලපත්‍ර 44 ක් අළුත් නොකිරීම සම්බන්ධයෙන් කටයුතු නොකිරීම නිසා රු. 268,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | මෙම කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස මේ වන විටත් ලිඛිත දැනුම් දීම සිදුකර ඇති අතර, ඉදිරියේදී හඳුනා ගන්නා සෙසු කර්මාන්ත සඳහාද දැනුම්දීම් සිදුකර ප්‍රතිචාර නොදක්වන කර්මාන්ත සඳහා නීතිමය කටයුතු සිදු කරන බව දන්වමි. |

**2.2.5 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රත්නපුර නගරයේ පිහිටි ප්‍රධාන බස් නැවතුම්පලට බස්රථ පිවිසීමේ ගාස්තු වශයෙන් 2009 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සබරගමුව බස් සමාගමෙන් අයවිය යුතු රු. 2,960,100 ක් අයකර ගෙන නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම මුදල අයකර ගැනීම සඳහා පළාත් සභාව මඟින් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 32,450,189 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය තුල මුද්දර ගාස්තු රු. 31,010,420 ක් ලැබී ඇති බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සකස් කර ඇති බව දන්වමි. |

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වාර්ෂික අයවැය ලේඛනයෙහි සුහසාධන සේවා වැඩ සටහන යටතේ විවිධ වැඩසටහන් 05 ක් සඳහා රු. 2,210,000 ක් වෙන්කර තිබුණද, එම වැඩසටහන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා දී ඇති වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රතිපාදන වැයකර නොතිබුණද, ජ්‍යෙෂ්ඨ පුරවැසි වැඩසටහන් හා ප්‍රජා සංවර්ධන සමිති වැඩසටහන් කිහිපයක් වර්ෂය තුල ක්‍රියාත්මක කළ බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ මහජන සෞඛ්‍ය අංශය මඟින් 2017 වර්ෂයේදී සිදුකර තිබූ සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්ව සමීක්ෂණයේදී මහා නගර සභා බල සීමාව තුල පවුල් ඒකක 155 කට සනීපාරක්ෂිත වැසිකිළි පහසුකම් නොමැති බව හඳුනාගෙන තිබූ නමුත් මහා නගර සභා ආඥා පනතේ ප්‍රතිපාදන අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුලත් කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කර ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 හා 2019 වසරවල ප්‍රතිපාදන නොතිබූ බැවින් වැසිකිළි පෝච්චි ලබා දීම සම්බන්ධයෙන් සැලසුම් සකස් නොකළ අතර, 2020 වර්ෂයේ අයවැය ලේඛනයෙන් ඒ සඳහා ප්‍රතිපාදන සපයා ඇති බැවින් නිසි ක්‍රමවේද සකස් කර එම දිරි දීමනාව ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාව සතු ගලි බවුසරය 2016 අගෝස්තු මස අනතුරකට ලක්වී තිබූ අතර, අළුත්වැඩියාව සඳහා රු. 151,610 ක් වැයකර තිබුණි. රක්ෂණාවරණය මඟින් රු. 64,891 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර, අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මූලික විමර්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශව හඳුනාගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති බවත්, වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නගරාධිපතිවරයාගේ නිල රථය 2018 ජූලි 26 දින අනතුරට පත්ව තිබුණු අතර, එය අළුත්වැඩියාව සඳහා රු. 202,388 ක් වැයකර තිබුණද, රක්ෂණාවරණය මඟින් රු. 81,614 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. අනතුර පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මූලික විමර්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශව හඳුනාගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති බවත්, වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව විසින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 07 ක ජල පාරිභෝගිකයින් 989 ක ගෙන් ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු. 1,800,000 ක වාර්ෂික ආදායමක් සභාවට අහිමි වී තිබුණි. 2012 නොවැම්බර් 29 දිනැති හා 2018 මැයි 14 දිනැති සභා තීරණ ප්‍රකාරව සියළු ජල ව්‍යාපෘති සඳහා ජල මනු සවි කලයුතු බවට යෝජනා සම්මත කර තිබුණද, එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම 2018 සැප්තැම්බර් මස මිලදී ගෙන තිබුණු වටිනාකම රු. 290,000 ක් වූ ජල මනු 200 ක් 2020 ජනවාරි වනවිටත් ගබඩාවේ ඉතිරිව තිබුණු අතර, 2019 මාර්තු 04 දිනෙන් ඒවායේ වගකීම් කාලයද අවසන්ව තිබුණි. | ජල මනු සවිකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ජල මනු සවිකිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා පනත හෝ වෙනත් චක්‍රලේඛයක් මඟින් මහජන නියෝජිතයින් වෙත ණය අත්තිකාරම් ලබාදීම සඳහා බලයක් ලබාදී නොතිබියදී මහජන නියෝජිතයින් 19 ක් වෙත ආපදා ණය වශයෙන් රු. 7,939,000 ක් 2018 හා 2019 වර්ෂ තුල ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු. 5,630,663 ක් අයවිය යුතුව තිබුණි. | මහජන නියෝජිතයින් වෙත ණය අත්තිකාරම් ලබාදීම සඳහා ලිඛිත නීතියක් යටතේ ප්‍රතිපාදන සලසා දී නොමැත. | මහජන නියෝජිතයින් සඳහා ණය අත්තිකාරම් ලබාදීම 2019 ජනවාරි 08 දිනැති මහා සභා රැස්වීමේ අංක 06:07 දරන සම්මුතියෙන් අනුමත කර ඇති බව දන්වමි. |

**3.5** **වත්කම් කළමනාකරණය**

**3.5.1** **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 01 සිට 06 දක්වා කාලයක් ධාවනයේ යොදවා නොතිබූ වාහන 04 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු යාවත්කාලීනව සිදුකළ යුතුවේ. | වාහන 02 ක් අළුත්වැඩියා කිරීමට නියමිත බවත්, ඉතිරි වාහන දෙක පිළිබඳව ඉදිරියේදී තීරණයක් ගන්නා බවත් දන්වමි. |

**3.5.2** **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලියාපදිංචි අයිතිය නොමැතිව සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 02 ක් විය. | අයිතිය නොමැති වාහන සභාව නමින් පවරා ගත යුතුවේ. | මෙම වාහන පවරා ගැනීමට අදාල ආකෘතිපත්‍ර සකස් කර ඇති බවත්, පවරා ගැනීමේ කටයුතු නොපමාව සිදු කරන බවත් දන්වමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සිනමා ශාලාවේ බදුකරුගෙන් 2001 මැයි 01 දින සිට 2010 අප්‍රේල් දක්වා කාලයට අදාල අයවිය යුතු රු. 1,953,000 ක් අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට 2020 ජූනි වනවිටත් කටයුතු කර නොතිබුණු අතර 2017 සැප්තැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා කාලයට අදාලව බදුකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,627,570 ක් අයකර ගැනීමට ද සභාව අපොහොසත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුවේ. | නීතිමය කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ රු. 54,566,853 ක ණයක් ලැබී තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියෙන් රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු තානායම් කුලියෙන් සියයට 50 ක් උක්ත ණය මුදලට හිලව් කර ගන්නා බව එහි අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියකින් දන්වා තිබුණද, අඩු කරගෙන ඇති ණය වාරික ප්‍රමාණය තහවුරු කරගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය වනවිටත් සම්පූර්ණ ණය මුදල වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අදාල ගැටළුව නිරාකරණය කර ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරියෙන් මීට අදාල තොරතුරු තහවුරු කර ගැනීමෙන් අනතුරුව විධිමත්ව තොරතුරු ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) (i) | පොම්පකැලය නාගරික වනෝද්‍යානය ප්‍රමාණවත් පරිදි නඩත්තු කර නොතිබීම හේතුවෙන් ජල පෙරනය අක්‍රීය වී ජල තටාකයද අපවිත්‍ර වී කිසිවෙකුත් ප්‍රයෝජනයට නොගන්නා තත්ත්වයට පත්ව තිබුණි. ආරම්භයේදී අක්කර 56 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වූ මෙම වනෝද්‍යානය අනවසර ඉදිකිරීම්, ආපදාවන්ට ලක් වූවන් පදිංචි කරවීම හා විසල් ජල ව්‍යාපෘතිය සඳහා ඉඩ පහසුකම් සපයා දීම නිසා වර්තමානය වනවිට අක්කර 35 කට පමණ සීමා වී තිබුණි. වනෝද්‍යානය සංරක්ෂණය සඳහා 2012 හා 2015 වර්ෂවලදී යෝජනා ඉදිරිපත් කර තිබුණද, එම යෝජනා කිසිවක් 2019 වර්ෂය අවසන් වනවිටත් ක්‍රියාත්මක කිරීමට මහා නගර සභාව අපොහොසත් වී තිබුණි. | නාගරික වනෝද්‍යානයේ ආරක්ෂාව, නඩත්තුව හා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතුවේ. | අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා 2012 හා 2015 වර්ෂවල යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, දැනට නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාවට නැංවෙමින් පවතින මෙගා පොලිස් වැඩසටහන යටතේ පොම්පකැලය සංරක්ෂණය ඇතුලත් කර ඇති බවත් දන්වමි. |
| (ii) | ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පොම්පකැලය රක්ෂිතයෙන් ජල යෝජනා ක්‍රමයක් සඳහා 2014 වර්ෂයේදී ලබාදී තිබුණු අක්කර 02 පර්චස් 28.81 ක් වෙනුවෙන් තක්සේරු වටිනාකම අනුව වර්ෂ 30 ක් සඳහා රු. 34,009,564 ක බදු මුදලක් ගෙවන ලෙස 2017 වර්ෂයේ දී ජල ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත දන්වා තිබුණද, ජල යෝජනා ක්‍රමයට අයත් භූමිය 1978 ජුනි 15 දිනැති ගැසට් නිවේදනයක් මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමය යටතේ පවරා ඇති බව දන්වමින් බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. අදාල කරුණු පිළිබඳව සභාව විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ගැසට් නිවේදනය පිළිබඳව පරීක්ෂා කර සභාවට අයවිය යුතු ආදායම් වේ නම් එය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගැසට් නිවේදනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති නමුත් ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැති බව දන්වමි. |
| (ඈ) | සීමාසහිත රත්නපුර දිසා සමුපකාර පේෂ කාර්මික සමිතියට බදු දී තිබුණු සභාව සතු පර්චස් 35.5 න් පර්චස් 4.95 ක් පමණක් 2009 වර්ෂයේ දී නැවත පවරා ගෙන තිබුණු අතර ඉතිරි බිම් ප්‍රමාණය නීත්‍යානුකූලව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉතිරි බිම් ප්‍රමාණය පවරා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී භූමි ප්‍රමාණය මැනුම් කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ඉ) | සභාවට අයත් රත්නපුර, පොම්පකැලේ, අක්කර 05 ක භූමිය හා එහි පිහිටි ගොඩනැගිල්ල, ටෙනිස් ක්‍රීඩා පිටි දෙක හා බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය රු. 350 ක වාර්ෂික බදු කුලියකට වර්ෂ 33 ක කාලපරිච්ඡේදයක් සඳහා රත්නපුර නීතීඥ සංගමය වෙත දීර්ඝ කාලීනව බදු දී තිබුණද, බදු කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත තීරණය කර නොතිබුණි. එමෙන්ම වසර 05 කට වරක් එකී තක්සේරුගත බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. වසර 33 සඳහා අදාල මුළු බදු කුලිය වශයෙන් රු. 11,550 ක් අදාල පාර්ශවය විසින් 2006 දෙසැම්බර් 08 දින සභාව වෙත ගෙවා | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතු අතර, ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුවේ. | නීතීඥ සංගමයෙන් ගිණුම් වාර්තා ඉල්ලා ඇති අතර, එම වාර්තා ගෙන්වා ගැනීමෙන් අනතුරුව මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද, නගරාධිපති විසින් විවිධ කරුණු දක්වා චෙක්පත ආපසු යවා තිබුණි. නමුත් 2019 දෙසැම්බර් වනවිටත් අදාල ගිවිසුම සංශෝධනය කිරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි. බදු ගිවිසුම ප්‍රකාරව ගොඩනැගිල්ල කුලියට දී සංගමය උපයන ආදායමින් 2/3 ක් සභාව වෙත ගෙවිය යුතු වුවද, වසර 19 ක බදු කාලය තුල කිසිඳු ආදායමක් සභාව වෙත ගෙවා නොතිබුණි. | | |
| (ඊ) | රත්නපුර, දෙමුවාවත, නගර සහා පෙදෙසෙහි අනවසරයෙන් ඉදිකර තිබූ සිව්මහල් ගොඩනැගිල්ලක් සඳහා සැලසුම් අයදුම්පත 2012 ජුලි 17 දින සභාව වෙත ලැබී තිබුණද, ගොඩනැගිල්ල නියමිත පිරිවිතර වලට අනුකූල නොවීම නිසා සැලැස්ම අනුමත කල නොහැකිව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාල ගොඩනැගිල්ල ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |